The Best Sri Lankan Wedding Magazine
August / September - 2017
ISSUE 004 Rs. 200/-

තාරුණ්‍යයේ
සොඳුරු සිහින
මංගල්‍යය
සැබෑ කිරීමට..

# My Dream Wedding

BEST SRI LANKAN WEDDING
MAGAZINE



## WEDDING STORY

## FLOTA WEDDING STUDIO & PHOTOGRAPHY

## Fresh 2017 FOR YOUR WEDDING

0770492119
Moris Mohan
PHOTOGRAPHY

Dressed By : Malisha Dissanayake (Saloon Melixa)
Photography : Moris Mohan Photography
Model : Sabeetha Ruwanmali

ISSN 2513-3004
9 772513 300007

PRESENT BY star CREATION

Follow us Facebook and View our Digital Magazine Online





## කර්තෘගෙන්...

මංගල ක්ෂේත්‍රයට ඇල්මක් දක්වන ඔබ වෙනුවෙන්ම මෙවරත් My Dream Wedding සඟරාවේ 4 වැනි කලාපය අප මෙසේ ඔබ අතට පත් කරන්නෙමු. කොළඹට පමණක් සීමා නොවී දිවයිනේ දිස්ත්‍රික්ක ගණනාවකම සිටින මෙම ක්ෂේත්‍රයට ඇළුම් කරන්නන් උදෙසා සඟරාවක් ලෙස අප මෙය ඔබට පිරිණමමු.

මෙවරත් පාඨක ඔබේ ඉල්ලීම පරිදිම සඟරාව විශේෂාංග කිහිපයකින්ම සමන්විතයි. ඒ සියල්ල මෙම සඟරාවට ප්‍රිය කරන පාඨක ඔබ වෙනුවෙන්මයි. සඟරාවේ කටයුතු සඳහා මා හට විවිධ අයුරින් උපකාර කළ සැමට මාගේ හද පිරි ස්තූතිය පුද කරන අතර, වචනයෙන් පවා මා සිත රිද වූ සැමටත් මා හදවතින්ම ස්තූතිවන්ත වෙමි. ඒ වෙන යමක් නිසා නොව, සිත් රිදුමක් පවා මා හට ජීවිතේ අභියෝගයක් වීමත්, ඒ තුළින් පවා මා ජීවිතේට බොහෝ දේ උගත් නිසයි.

එමෙන්ම මෙම සඟරාව පිලිබඳව ඔබගේ අදහස්, යෝජනා හා චෝදනා සියල්ල අප වෙත එවන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු.

කර්තෘ - ගයේෂා අබේගුණවර්ධන.


My Dream Wedding
BEST SRI LANKAN WEDDING MAGAZINE

Follow us Facebook and View our Digital Magazine Online

mydreamweddingmagazine@gmail.com

My Dream Wedding Magazine

Hotline : 070 222 8048

star CREATION

Star Creation (Pvt) Ltd

Head Office : High Level road, Maharagama, Sri Lanka.

starcreationteam@gmail.com www.starcreation.lk

Hotline 0777 980630



Director Gayesha Abegunawardhana

Manager Anuradha Sugathapala

Graphics Designer Umanda Nuwan Gunasekara

Marketing Executive Hashan savinda


STUDIO LIONS
capture your movements

No. 7/1/1, Hill Street, Kandy, Sri Lanka.
Contact : 077 1362387
Web : www.studiolins.com | Mail : studiolions@gmail.com
Facebook: Chandana Wijayarangana
PHOTOGRAPHY : CHANDANA WIJAYARANGANA



# Contents


- Studio Lions 02/05
- Salon Aparna 06-07
- Moris Mohan Photography & Salon Meluxa 08-10
- With Star 11-12
- Nirmana Flora 13-14
- Salon Jeewa 15
- Salon Nishadi 16
- Jewitheta Adaren 17
- Dream Wedding 18-19
- Studio3000 22-23




STUDIO LIONS
capture your movements

CHANDANA WIJAYARANGANA
PHOTOGRAPHY
HOTLINE : +94 77 13 62 387







STUDIO LINONS
No. 7/1/1, Hill Street, Kandy, Sri Lanka.
Contact : 077 1362387
Mail : studiolions@gmail.com | Facebook: Chandana Wijayarangana
web : www.studiolins.com


Salon
Aparna
Bridle Dressing, Beauty Care
Matara road, Kamburupitiya.
Tel : 0718017706 / 0776162395








Salon
Aparna

Bridle Dressing, Beauty Care


Matara road, Kamburupitiya. | Tel : 0718017706 / 0776162395



Hair Cuts Facial
Cleanup Eyebrow Shaping
Threading Hair Colouring
Bridal Dressing Makeup
Manicure Pedicure, etc...



# Moris Mohan




077 0492 119
071 9461 753

Moris Mohan Photography

Moris Mohan Photography

mohan.moris0@gmail.com


THE
IMMORTAL SOUL

DEATH WAITS FOR NO ONE.BEYOND THE PALE
EVERYTHING IS BLACK, NO TURNING BACK

EVAN | MAHI



**මෙවර with Star විශේෂාංගය තුලින්
අපි කතාකරන්නේ වසර 14 ක් පුරා සිරස TV තුලින් ප්‍රවෘත්ති
නිවේදිකාවක් ලෙස අප කාගෙත් සිත් ගත් ඔමායා කෝවිලගොඩගේ
සමඟයි. ඇය මේ වන විට ප්‍රවෘත්ති නිවේදිකාවක් මෙන්ම සිරස TV
ප්‍රවෘත්ති අංශයේ සහකාර කළමණාකාරිනියක් ලෙසත්
කටයුතු කරනු ලබනවා.**

**■ ඔමායා, ඔබ කොහොමද ඔබේ මාධ්‍යය ජීවිතය මුලින්ම පටන් ගත්තේ?**



මම කොළඹ විශාඛා විද්‍යාලයේ 06 වන වසරේ ඉගෙනුම ලබන කාලයේදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ළමා පිටියේ ළමා නිවේදිකාවක් සහ ළමා ශිල්පිණියක් විදියට තමයි මුලින්ම මාධ්‍යයට පිවිසියේ. 1999 වර්ෂයේ පාසල් කාලය ඉවර වෙනකොටම වෙළඳ සේවයට සහ ස්වදේශීය සේවයට සහන නිවේදිකාවක් විදියට මං පත්වුණා. එහිදී ගුවන් විදුලි සංස්ථාවෙන් පටන් ගත්ත පවන රේඩියෝ නාළිකාවේ මම නිවේදිකාවක් ලෙස කටයුතු කළා. ඇත්තටම මම අද රූපවාහිනී නිවේදිකාවක් වුණාට මම මුලින්ම ගුවන් විදුලි නිවේදිකාවක් විදියටයි මාධ්‍යට ආවේ. පසුව 2003 වර්ෂයේදී ප්‍රවෘත්ති නිවේදිකාවක් සහ ප්‍රවෘත්ති වාර්තාකාරිනියක් ලෙස සිරස TV නාළිකාවට සම්බන්ධ වුණා.

**■ කොහොමද ප්‍රවෘත්ති අංශයේ ඔබගේ වර්තමාන කටයුතු?**


දැනට සිරස TV නාළිකාවේ ප්‍රවෘත්ති නිවේදිකාවක් සහ ප්‍රවෘත්ති සහකාර කළමණාකාරිනියක් විදියට මං කටයුතු කරනවා. මේ දවස්වල ගම්මැද්ද වැඩසටහන යටතේ විශේෂ ක්‍රියාන්විතයක් පටන් අරන් තියෙනවා ජනතාවගේ සුභ සිද්ධිය සඳහා. ඉතිං ඒ කටයුතුත් කරගෙන යනවා.

**■ ඔබේ ප්‍රේක්ෂකයින්ගෙන් ලැබෙන ප්‍රතිචාර කොහොමද?**

රූපවාහිනිය නිසා මාව මේ රටේ ඔමායා කියලා දැනගත්තනම් ඒ සිරස TV නිසයි. ජනතාව අතර සිරසෙ ඔමායා කියලා ගෞරවයක් මට තියෙනවා. ඒක මට කවදාවත් අමතක කරන්න බෑ. අමතක වෙන්නෙත් නෑ. මගේ සමාන්‍යය ජීවිතයේදී කොහෙට හරි ගියාම මගේ කටහඬ සහ රූපය එකට මිශ්‍ර වෙලා තමයි ජනතාව මාව හඳුනා ගන්නේ.

**■ ඔබේ මාධ්‍ය ජීවිතයේ අමතක නොවනම සිදුවීම මොකක්ද?**

අමතක නොවනම සිදුවීම තමයි 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනය මාධ්‍යවේදිනියක් විදියට ප්‍රවෘත්ති වාර්තා කිරීමට සිදුවීම. එදා සුනාමි එනකොට සුනාමි කියලා වචනයක්වත් එහි තේරුමක්වත් කවුරුත් දැනන් හිටියේ නෑ. ලංකාවට ඒ තරම්ම දරුණු තත්වයක් කියලා කවුරුත්ම මුලින් විශ්වාස කළෙත් නෑ. ඒ කාලේ මම සිරසට අළුත්. ඒත් එදා මම මාධ්‍යවේදිනියක් විදියට මා කළ යුතු දේ හරියටම කළා. බොහෝ දුෂ්කර අත්දැකීම්වලට මුහුණ දෙන්නත් සිදුවුණා. ඒ නිසා එදා මට මගේ මාධ්‍ය ජීවිතේ අමතක නොවනම දවසක්.




**■ කාන්තාවක් විදියට මාධ්‍යය ක්ෂේත්‍රයේදී ලැබෙන අභියෝග මොනවාද? කොහොමද ඔබ එවා ජය ගත්තේ?**

ප්‍රවෘත්ති කාමරයේ විතරක් නෙවෙයි. මේ රටේ කාන්තාවකට ලැබෙන අවස්ථාව ගොඩාක් සීමිතයි. විශේෂයෙන්ම පුරුෂාධිපත්‍යය තියෙන රටක් මේක. පුරුෂාධිපත්‍යය මඟින් හැම විටම කාන්තාවට අවම සැළකිල්ලයි ලැබෙන්නේ. එක ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරයෙක් මටම කියලා තියෙනවා කවදාවත් ගැහැණියකට ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරියක් වෙන්න බෑ කියලා. ඒ විතරක් නෙවෙයි. ඔවුන් ඒ අනුව කටයුතුත් කරනවා. කවදාවත් ගැහැණියකට තියෙන දක්ෂතාවයවත්, ඔවුන්ගේ හැකියාවන්වල වටිනාකමක්වත් හඳුනා ගන්නේ නෑ. නමුත් ඒ අය නොදන්න කාරණය තමයි හැම විටම කාන්තාවකට ප්‍රවෘත්ති වාර්තාකරණයේදී හෝ ප්‍රවෘත්ති සම්බන්ධව කටයුතු කරනකොට දැනෙන හැඟීම් සහ දැනීම් ද වැඩි බව. මම මගේ ප්‍රවෘත්ති කාමරයේ විතරක් නෙවෙයි. ඕනෑම තැනක දැකලා තියෙන දෙයක් ඒක. සමාජයේ සිටින බහුතරයක් හිතන්නේ කාන්තාවකට බොහෝ දේ කරන්න බෑ කියලා. යම් අවස්ථාවක් ලැබිලා දෙයක් කරොත් තමයි ඒ අය හිතන්නේ ඒ අයට වගේම කාන්තාවකටත් යමක් කළ හැකි බව. මං හිතතන්නේ ඕනෑම තැනක ඒ අවතක්සේරුව තියෙනවා. ඒ නිසා කාන්තාවකට වැඩ කිරීමට නොදීම සහ යම් සීමාවකට කොටුකර තැබීමට උත්සහ කිරීම තමයි මං දකින ලොකුම අභියෝගය. මම නම් ඒ අභියෝගය ජය ගන්නේ මට ප්‍රවෘත්ති කාමරයේදී ලැබෙන පුංචි අවස්ථාවෙන්. නැත්නම් කවදාවත් මං හිතන්නෑ ලොකු විශ්වාසයකින් කාන්තාවකට දේවල් පිරිණැමෙනවා කියලා.








SALON MELIXA
BRIDAL HAIR BEAUTY




Malisha Dissanayaka

☎ 011 5 680 559 📞 070 2 700 888 📱 077 6 60 60 44
✉ salonmelixa@gmail.com
ⓕ www.facebook.com/malisha.disanayaka.94
📍 No - 562,Rawathawattha,Moratuwa






# Moris Mohan



077 0492 119
071 9461 753

Moris Mohan Photography

Moris Mohan Photography

mohan.moris0@gmail.com







Malisha Dissanayaka

SALON MELIXA
BRIDAL HAIR BEAUTY

011 5680 559 070 2700 888 077 6606 044

salonmelixa@gmail.com

www.facebook.com/malisha.disanayaka.94

No - 562,Rawathawattha,Moratuwa




**■ ඔමායා, ඔබේ මාධ්‍යය ජීවිතය ගැන කතා කළා වගේම, ඔයාගේ ආදරණීය පවුල ගැනත් ටිකක් කතා කළොත්...**

මගේ සැමියා ජයන්ත කෝවිලගොඩගේ. ඔහු වෘත්තියෙන් ආර්ථිකවේදියෙක්. ඒ වගේම ඔහු නිදහස් ව්‍යාපාර මාධ්‍යවේදියෙක් ලෙසත් කටයුතු කරනවා. දෙරණ TV නාළිකාවේ **Biz 24x7** වැඩසටහනින් ඔහුව දැක ගන්න පුළුවන්. මගේ සුරතල් පුංචි පුතා බිපුන් බානුජ කෝවිලගොඩගේ. පුතා කොළඹ ශාන්ත ජෝසප් විද්‍යාලයේ පළමු වසරේ ඉගෙනුම ලබනවා. ඉතිං අපේ පුංචි පවුලේ, අපි ගොඩක් සතුටින් කාලය ගත කරනවා.

**■ මවගෙ අභාෂයෙන් දවසක ඔබේ පුංචි පුතත් මාධ්‍යය ක්ෂේත්‍රයට ආවොත්... එයට ඔබ කැමතිද?**

දරුවා මොන ක්ෂේත්‍රයක් තෝරා ගනීවිද කියලා දැන්ම කියන්න බැහැ. නමුත් මගේ දරුවා මාධ්‍යය ක්ෂේත්‍රයට එනවට පෞද්ගලිකව මම කැමති නැහැ. මොකද මාධ්‍යය ක්ෂේත්‍රය හිතන තරම් සුන්දර නැති නිසා. මෙහි තිබෙන අවතක්සේරුවීම්, පීඩාකාරී තත්වයන් එක්ක බලනකොට මට හිතෙනවා මගේ දරුවා මේවා කරන්න ඕන නෑ කියලා. මොකද මං දන්නවා, දැන් මේ ලෝකෙ ඊට වඩා අපට කරන්න පුළුවන් දේවල් තියෙනවා කියලා.





**■ ඔබේ විනෝදාංශ මොනවාද?**

ප්‍රවෘත්ති අංශයක සේවය කරනකොට විනෝදාංශයක් කියලා දේවල් කරන්න අවස්ථාව හරිම අඩුයි. ඒ හැම දේම කැපකරලා තමයි ඕනෑම මාධ්‍යවේදියෙක් ප්‍රවෘත්ති අංශයක සේවය කරන්නේ. නමුත් මං කැමතියි මගේ හොඳම යාළුවොත් එක්ක කාලය ගත කරන්න. ඒ වගේම මම කැමතියි නිතරම සිංදු අහන්නත්, චිත්‍රපට බලන්නත්.



**■ ඔබේ දියුණුවට අන් අයගෙන් ලැබෙන සහයෝගය කොහොමද?**

ඒ ප්‍රශ්ණෙදී මං කැමතියි මගේ තාත්තා ගැන කතා කරන්න. මගේ තාත්තා M.W.W සිරිසේන. ඔහු නැත්නම් අද ඔමායා කියලා කෙනෙක් නෑ. මොකද මම අද මේ තත්වයෙන් ඉන්නේ මගෙ තාත්තා නිසා.


**■ ඔයාට ආදරය කරන, ඔයාගේ ආදරණීය ප්‍රේක්ෂකයින්ට කියන්න තියෙන්නේ මොකක්ද?**

මම නොදන්න, හදිසියේම මට හමුවන අයත් එක්ක බැලුවම මගේ මුල් ස්වරූපය සහ මේ ස්වරූපය දන්න මං ගැන හොයලා බලන ප්‍රේක්ෂක පිරිසක් මට ඉන්නවා. සමහර වෙලාවට පුංචි පුංචි අඩුපාඩුකම් වුණත් පෙන්වන මං ගැන විශේෂ අවධානයක් යොමු කරන පිරිසක් ඉන්නවා. ඒ වගේම මං පුංචි තිරයේ දක්වන සමහර දක්ෂතාවයන් නිසාත් මට ආදරය කරන පිරිසක් ඉන්නවා. ඒ අය හැමෝටම ගොඩාක් ස්තූතියි. මං නිතරම උත්සහ කරන්නෙ රූපවාහිණී තිරයේදී හරියට දෙයක් කරන්න. එහෙම හරියට දෙයක් කරනවට අදටත් හෙටටත් ඒ අය දක්වන ප්‍රතිචාර වලට මං ගොඩාක් ආදරෙයි.

සටහන - ගයේෂා අබේගුණවර්ධන.








Décor for Weddings & Events ...

නිර්මාණ flora

Not only a concept.. It's a magic..

Decor for **Weddings & Events....**

Peradeniya road, Kandy, Sri Lanka. 0776208880, 0717208880 www.nirmanaflora.lk/




**ජීවිතේට ආදරයෙන් විශේෂාංගය කියවපු බොහෝ දෙනාගේ ඉල්ලීම වුණේ, අප මෙතෙක් ජීවිතය, ආදරය සහ විවාහය පිළිබඳව කතා කළා වගේම, අපි පණත් තරම් ආදරය කළ කෙනෙක් අපිට අහිමි වුණොත්, එය විඳ දරා ගන්නා ආකාරයත් ජීවිතේට ආදරයෙන්ම කියා දෙන්න කියලයි.**

අද සමාජයේ මෙවැනි සිදුවීම් නිසා නිරපරාධයේ අපට අහිමිවී යන මිනිස් ජීවිත ගණන දිනෙන් දින වැඩිවෙනවා. අහිමිවීමක් සිදුවූ විට හදවතට දැනෙන උහුලාගත නොහැකි වේදනාවන් ඉදිරියේ මිනිසා විවිධ ආකාරයෙන් හැසිරෙනවා. අයෙක් වේදනාවන් දරාගත නොහැකිව තමන් විසින්ම තමන්ගෙ ජීවිතයට සමුදෙද්දී, තවත් අයෙක් තමන්ට අහිමි වූ දේ වෙනත් කිසිවෙකුටවත් හිමි නොවිය යුතුයි සිතා මනුෂ්‍ය ඝාතන සිදුකරනවා. සමාජයේ මෙවැනි පිරිහීම් නිසාත්, බොහෝ දෙනාගේ ඉල්ලීම නිසාත් මම හිතුවා, අප බොහෝ සෙයින් පෙම් කළ අයෙක් අපට අහිමි වුවහොත්, අප එය කෙලෙස විඳ දරා ගත යුතුද යන්න පිළිබඳව, ඔයාගෙ ජීවිතේට ආදරයෙන්ම, ඔයාගෙ හිතත් එක්ක ටිකක් කතා කරන්න.

ඔයා පණත් තරම් එයාට ආදරය කරනකොට, ඔයා කොහොම හිතන්න ද නේද?... දවසක ඔයාට එයාව අහිමි වෙයි කියලා. ජීවිතේ කවදාවත්ම ඔයා නොහිතපු මොහොතක, නොහිතපු විදියට එහෙම දෙයක් මේ ජීවිතේ කවදාහරිම දවසක ඔයාටත් සිදු වුණානම්, ඔයා හොඳටම දන්නවා ඇති එදා අසරණ වුණේ ඔයාගේ ඔය හදවත විතරක් නෙවෙයි, ඔයාගෙ අහිංසක මුළු ජීවිතේම කියලා. එදා ඔයාට දැනෙන්න ඇති හදවත දුක් ගින්නකින් පිච්චිලා ගියා වගේ හැඟීමක්. එහෙම නේද?... ඒ වෙලාවට ඔයාගෙ හිතට දැණුන වේදනාවත්, තනිකමත්, පාළුවත් එක්ක ඔයා හිතන්නත් ඇති මේ ලෝකෙ ඉන්න අවාසනාවන්තම කෙනා ඔයා කියලා. ඒත් ඔයා තේරුම් ගන්න... ආදරේ වැඩිකමටම දුක වැඩි නිසා ඔයාට එහෙම හිතුනට ඇත්තටම ඒක එහෙම නෙවෙයි කියලා. අවංකම ආදරය කරලා දුක් විඳින, ලෝකෙ ඉන්න එකම කෙනා ඔයා විතරක් නෙවෙයි. තව ඕන තරම් අය මේ ලෝකෙ ඉන්නවා. ඒ විතරක්ද?... ජීවිතේ විවිධ හේතු නිසා දරාගන්න බැරි තරම් වේදනාවල් සිතින් දරාගෙන, ඒ දුක කාටත් නොකිය තනියම විඳවන මිනිස්සුත් මේ ලෝකෙ ඕන තරම් ඉන්නවා. ඒ අය අතර ඔයත් තව එක්කෙනෙක් විතරයි. ඉතිං දැන් ඔයාට වැටහෙනවා ඇති, ඔයා හිතන තරම්ම, ඔයා අවාසනාවන්ත නෑ කියලා.

ආදරය නිසා ඔයාගෙ සිත අද වන විටත් දුකින්නම් ඔයා ඉවසන්න. ඉවසලා බැහැ කියලා හිතෙනවා නම්, ඒත් ඉවසන්න. මොකද ඔයාටම හිමි ආදරයක් මේ ලෝකෙ කොහේම හරි තැනක තියෙනවා. දවසක ඒ ආදරය ඔයාට හමුවේවි. ඉතිං ඉවසන්න. ඒ දවස ලඟදිම ඒවි...

හිමිවී අහිමිව යන බැඳීම් ඉදිරියෙ ඔයා නිර්දෝශනම්, කව්රුවත් කරන වැරදි වලට ඔයා කවදාවත්ම ඔයාගෙ ජීවිතේ විනාශ කරගන්න නම් යන්නෙපා. මනුස්ස ආත්මයක් ලැබෙන්නෙ කෙනෙකුට කලාතුරකින්. ඉතිං ඔයා ලබපු මේ උතුම් මනුෂ්‍යත්වයට නිගාවන දෙයක් නම් කරන්න එපා. ඔයා එහෙම කළොත් ඒක ඔයාගෙ මුළු සංසාරෙටම ඔයා කරගන්නා අකුසලයක් කියලත්, ඔයා කවදාවත්ම අමතක කරන්න එපා.

අපි කාටහරි අවංකවම ආදරය කරනකොට ඒ ආදරය අපේ මුළු ජීවිතේම වෙනවා. ආදරය ඉදිරියෙ අන්ධ වුණාම ඒ අය අපට වරදක් කළත් අපි වරදක් දකින්නෙ නැහැ. ඒ වෙනුවට අපි අපේ හිතින්ම සියල්ල නිවැරදිකරණය කරනවා. මොකද අපි ඒ අයට ආදරේ නිසා. ආදරය කියන වචනයට ඔයත්, මමත්, මේ ලෝකෙ හැම කෙනාමත් ලෝභයි. කව්රු කොහොම කිව්වත් යථාර්තය එයයි. ඒකනෙ... අපි උපන් දා සිට මියෙන තුරාවටම, තවත් කෙනෙකුගෙ ලෙන්ගතුකමක පහස පතන්නෙ...

අවංකවම ආදරය කළානම්, ඒ ආදරය වෙන් කරන්න මේ ලෝකෙ කාටවත්ම බැහැ. ඒ ආදරේ කොතැනක හෝ වරදක් තිබුණ නිසයි ඔයාට එයාව අහිමි වුණේ. එයාට පුළුවන් නම් එච්චර ආදරය කරලත්, ඔයාගෙන් ඈත් වෙලා ජීවත් වෙන්න, විශ්වාස කරන්න... ඔයාටත් පුළුවන් එයා නැතිව ජීවත් වෙන්න. එහෙම ජීවත් වෙන්න පටන් ගත්තම ඔයා දන්නෙම නැතිව දවසක ඔයා තේරුම් ගන්නවා. ඔයා කොයිතරම් හිතන් හිටියත් ඔයාට ගැලපෙනම කෙනා එයා කියලා. ඒත් ඊටත් වඩා ගැලපෙන හොඳ මිනිසුන්, මේ ලෝකෙ තවත් ඉන්නවා කියලා. අන්න එහෙම කෙනෙක් ඔයාගෙ ජීවිතේට හමුවුණ දවසක ඔයා ගොඩක් සතුටින් හිඳීවි. සත්තකින්ම ඔයා එයත් එක්ක හිටියටත් වඩා සතුටකින්, ඔයා එදාට ජීවත් වේවි.

ඒ වගේම, ඔයාව එපා කියලා යන්න යන කෙනෙක්ව ඔයා කවදාවත්ම නවත්වන්න එපා. එහෙම එයා ඔයාව දාලා යන්න හදනවා නම්, ඔයා එයාට යන්න දෙන්න... අවංකවම ඔයා එයාට ආදරය කළා නම්, කොයිතරම් දුකක් වුණත්, එයාගෙ සතුට වෙනුවෙන් ඔයා ඒ කැපවීම කරන්න. මොකද ආදරය, ලෙන්ගතුකම කියන දේවල්, හදවතින්ම උපදින හැඟීමකින් මිස කවදාවත්ම අපි ලඟ බලෙන් නතර කරගන්න අපට බැහැ. එහෙම කළත් එයින් කිසිම ප්‍රතිඵලයක් නැහැ. ඒ සියල්ල තාවකාලිකයි.



ඉතිං එහෙම, ඔයාව දාලා යන කෙනෙක්ට ඔයා කවදාවත් වෛර කරන්න එපා. එයාට ඊර්ෂියා කරන්නත් එපා. ඒ වගේම ඔයාට එයාව නොලැබී, තව කෙනෙක්ට එයාව හිමිවෙනවා කියලා, වෛරී චේතනාවක් ඇති කරගෙන, ඔයා එයාටවත්, එයාගෙ කියලා ඉන්න කිසි කෙනෙකුටවත් හිංසාවක් කරන්න තියා හිතන්නවත් එපා. තේරුම් ගන්න... අපිට අපිවවත් අයිති නැති මේ ලෝකෙ, අපිට තව කෙනෙක්ගේ ජීවිතයක් හිතුමතේ විනාශ කරන්න කොහෙත්ම අයිතියක් නැහැ කියලා...

ඉතිං සියල්ල වටහා ගත්තා සේම, ඔයත් උත්සහ කරන්න... අපි ජීවත් වෙන මේ පුංචි කාලය තුළ, ඔයාටම හිමි දෙවලුත් එක්ක, ඔයාගෙ ලෝකයෙ හරි සතුටින් ජීවත් වෙන්න...



සටහන - ගයේෂා අබේගුණවර්ධන.



Nishadi Perera
(Professional Beautician)
NVQ Level 4 Qualified

# Salon Nishadi

Bridal | Hair | Beauty













Salon Nishadi,
In front of Theldeniya depot.
Theldeniya, Kandy.
Call 077 280 8119

Salon Nishadi



# Salon Jeewa
WELIGAMA



Jeeva Jayaweera

NVQ Level 4, City Duilds, High Diploma.
Professional Beautician & Hair Dresser
Weligama. Tel : 077 158 3612



# Dream Wedding



**තාරුණ්‍යයේ සොඳුරුතම සිහිනය නම් වූ විවාහය සැබෑවක් කරගත් තවත් යුවළක් පිළිබඳවයි අදත් අපි Dream Wedding විශේෂාංගය තුළින් කතා කරන්නේ.**

**මහනුවර, කටුගස්තොට ප්‍රදේශයේ පදිංචි තිළිණ රාජපක්ෂ වෘත්තියෙන් ප්‍රවෘත්ති සංස්කාරකවරයෙක්. ඔහු සේවය කරන්නේ සියත TV ප්‍රවෘත්ති අංශයේ. ඔයුගේ ආදරණීය මනාළිය වුණේ කැළණීය ප්‍රදේශයේ පදිංචි දුෂානි නානායක්කාර. ඇයත් ප්‍රවෘත්ති සංස්කාරකවරියක්. ඒ වගේම ප්‍රවෘත්ති නිවේදිකාවක්. ඒ ස්වර්ණවාහිනී ප්‍රවෘත්ති අංශයේ.**

**▪ දුෂානි ඔයාට කොහොමද තිළිණව මුණගැසුණෙ?**

ඇත්තටම අපි මුලින්ම දැක්කෙ නැහැ. අපි දෙන්නා කතා කළා විතරයි. හඬ නිසා තමයි අපි දෙන්නා අද මේ විදියට ඉන්නෙ. මගෙ යාළුවෙක් ඉන්නවා එයාගෙ මල්ලි කෙනෙක්. එයාට කතාකරපු දවසක අහම්බෙන් වගේ මට තිළිණත් එක්ක කතා කරන්න ලැබුණා. ඉතිං ඒ විදියට තමයි මං තිළිණව මුලින්ම හඳුන ගත්තෙ.

**▪ තිළිණ, ඉතිං ඒ විදියට දුෂානි එක්ක කතාකරන්න ලැබුණ අවස්ථාවෙ ඔයාට මොකක්ද හිතුනෙ?**

මට දුෂානිගෙ කටහඬ හිතට හුඟාක් පුරුදුයි වගෙ දැණුනා. ඇත්තම කිව්වොත් මම ඒ හඬත් එක්ක එදා ඉඳන්ම මගේ හිතින් බැඳුනා. ඉතිං මගේ ආදරය ඉපදුනේ අන්න ඒ විදියටයි.




## Our Production Services...

- My Dream Wedding Magazine
- Dream Wedding Planning
- Wedding Video
- Wedding Photography
- Wedding Pre Shoot
- Documentary
- Music Video
- Music Audio
- Short Films
- Profiles
- Event Management
- Commercials

star CREATION

**Star Creation (Pvt) Ltd**

Head Office : 10/3 A, Katuwawala road, Maharagama, Sri Lanka.

www.starcreation.lk starcreationteam@gmail.com

**Hotline 0777 980630**

My Dream Wedding
BEST SRI LANKAN WEDDING MAGAZINE

ඔබත් ඔබේ ආයතනයේ
වෙළඳ දැන්වීම් සමගින්
අප හා එක්වන්න....

Hotline 0777 980630





My Dream Wedding
BEST SRI LANKAN WEDDING MAGAZINE

# අලෙවි විධායක නිලධාරීන් අවශ්‍යයි

කැපවීමෙන් හා ආත්ම විශ්වාසයෙන් වැඩ කළ හැකි
අලෙවි ක්ෂේත්‍රයේ පළපුරුද්ද හෝ දැනට වෙනත් සේවයක නියුතු
මනා සන්නිවේදන කුසලතා හිමි
**අප සොයන්නේ ඔබයි...**

මාසිකව
රු.50000/-
වැඩි මාසික
ඉපයීමක්

star CREATION
**Star Creation (Pvt) Ltd**
Head Office : 10/3 A, Katuwala road, Maharagama, Sri Lanka.
www.starcreation.lk starcreationteam@gmail.com

**Hotline 0777 980630**

ඔබගේ අයදුම් පත ඉහත විද්‍යුත් ලිපිනයට යොමුකරන්න...






■ **දුෂානි, ඔයත් එදා ඉඳන්ම තිළිණට ආදරය කරන්න පටන් ගත්තද?**

නැහැ. අපි මුලිම හොඳ යාළුවන් වුණා. අවුරුද්දක් විතර ඒ යාළුකම තිබුණා. ඊට පස්සෙ තමයි යාළුකම ආදරයකට පෙරලුණේ.

■ **දුෂානි, ඔයාට මතකද තිළිණ ඉස්සෙල්ලාම ඔයාට ආදරෙයි කිව්ව දවස?**

ඔව් ගයේෂා. ඒ දවස මට අද වගේම මතකයි. එක දවස හවස් වෙලාවක එයා මට දුරකථනයෙන් කතාකරලා කිව්වා එයා මට ආදරෙයි කියලා. එයා ඒකට මගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා කිව්වා. හැබැයි ඒකට පිළිතුර දෙන්න ඕන එයාව හමුවෙලා කියලා කිව්වා. මං එයාව හමුවෙනවා කියලා හිතං හිටියෙ නෑ. ඒත් අපි හමු වුණා.

■ **තිළිණ, දුෂානි ඔයාව හමුවෙලා කොහොමද ඔයාට පිළිතුරු දුන්නෙ?**

දුෂානි මට පිළිතුරු දුන්නෙ මට කැමතියි කියලා නෙවෙයි. එයා මේ ගැන එයාගෙ දෙමව්පියන්ගෙන් අහන්න ඕන කිව්වා. ඒ අය කැමති වුණොත් ප්‍රශ්ණයක් නෑ කිව්වා. හැබැයි එයා එහෙම උත්තර දුන්නට ඇත්තටම කිව්වොත් අපි එදා ඉඳන්ම ආදරය කළා. ගෙදරින් අවසර ගන්නකම් හිටියෙ නෑ.

■ **ඉතිං දුෂානි, ගෙදරින් එක පාරටම තිළිණට කැමති වුණාද?**

මං තිළිණ ගැන අම්මටයි තාත්තටයි කිව්වාම මං කිව්ව විස්තර අහලා මගේ ගෙදර අය තිළිණට කැමති වුණා. මොකද ඒ වෙන-කොටත් මගේ දෙමව්පියන් දැනගෙන හිටියා අපි හොඳ යාළුවන් කියලා. ගෙදරින් මට කිව්වා ඔයාට බුද්ධියක් තියෙනවා. ඔයා මේ ගැන තීරණයක් ගන්න කියලා.

■ **තිළිණ, ඔයාගෙ ගෙදරින් මේ ගැන දක්වපු ප්‍රතිචාර කොහොමද?**

මං ගෙදරට කිව්වම, මගේ අම්මට ඕන වුණා තීරණයක් ගන්න කලින් මුලින්ම දුෂානිව දකින්න. පසුව අම්මා විතරක් ආවා දුෂානිව බලන්න. ඊට පස්සෙයි මට මගේ දෙමව්පියන්ගෙන් අවසර ලැබුණේ.

■ **දුෂානි, ඔයාගෙ ආදරේ අමතක නොවනම දවස මොකක්ද?**

දවසක් මං හිරු TV එකේ සේවය කරන කාළේ වැඩ අවසන් වුණාම තනියම ගෙදර යන්න වෙනවා කියලා තිළිණට කිව්වාම, එයා මට ඉන්න කියලා, නුවර ඉඳන් ඇවිත් මාව ගෙදරට දාලා ආයෙත් නුවර ගියා. එදා මට එයාගෙන් දැණුන රැකවරණයවත් ඒ ආදරයවත් කවදාවත්ම අමතක වෙන්නෙ නෑ.

■ **තිළිණ, ඒ ප්‍රශ්ණයම මම ඔයාගෙනුත් ඇහුවොත්?**

මට නම් ගයේෂා, මගේ ආදරයෙ ගෙවිච්ච හැම දවසක්ම මට වැදගත්.
ඒ තරමටම මං මගේ ආදරයට ආදරෙයි. ඒ නිසා ඒ දවස් වලින් එක
දවසක් සුවිශේෂියි කියලා තෝරගන්න ඇත්තටම මට තේරෙන්නෙ නැහැ.

■ **දුෂානි, ඔයාලා කොහොමද විවාහය සැළසුම් කළේ?**

අවුරුදු 5 ක් විතර අපි ඒ විදියට ආදරය කරලා තමයි විවාහ වුණේ.
අපි දෙන්නම තීරණය කළේ තනි දවසක Wedding එකක් ගන්න.
ඒත් අපේ දෙමව්පියන්ට ඕන වුණේ ඒක දවස් 2 කට ගන්න.
ඒ නිසා තිළිණත් මමත් දෙමව්පියන්ගෙ කැමැත්තට ඉඩ දුන්නා.
ඒ අනුව අපි අපේ විවාහය සැළසුම් කළා.

අපි අපේ Wedding එක ගත්තෙ කටුනායක Eagle's Lagoon view
Home coming එක තිබුණෙ පේරාදෙණිය Oak Ray Regency
මාව හැඩගැන්වීම් කළේ චම්පි සිරිවර්ධන.
තිළිණගේ ඇඳුම් - ඇහැලේපොළ නිළමේ ආභරණ.

Wedding Photography - Tharindu Jayakody Photography &
Rasika Wijerathna Photography
Wedding Videography - 1st Lane Studio
Wedding Decoration – Sha Flower

සටහන - ගයේෂා අබේගුණවර්ධන.





www.studiolins.com
CHANDANA WIJAYARANGANA
PHOTOGRAPHY
HOTLINE : +94 77 13 62 387


STUDIO3000DF
The Camera is only a tool, we make the difference...
STUDIO 3000 DF.
BAMBALAPITIYA
+94 (11) 4003000
GALLE FACE HOTEL
+94 (11) 4873000
MOUNT LAVINIA
+94 (11) 4973000
PELIYAGODA
+94 (11) 4853000
NEGOMBO
+94 (11) 4943000







STUDIO3000DF
The Camera is only a tool, we make the difference...

BAMBALAPITIYA +94 (11) 4003000
GALLE FACE HOTEL +94 (11) 4873000
MOUNT LAVINIA +94 (11) 4973000
PELIYAGODA +94 (11) 4853000
NEGOMBO +94 (11) 4943000


STUDIO3000DF
The Camera is only a tool, we make the difference...
STUDIO 3000 DF.
BAMBALAPITIYA
+94 (11) 4003000
GALLE FACE HOTEL
+94 (11) 4873000
MOUNT LAVINIA
+94 (11) 4973000
PELIYAGODA
+94 (11) 4853000
NEGOMBO
+94 (11) 4943000



www.studiolins.com
CHANDANA WIJAYARANGANA
PHOTOGRAPHY
HOTLINE : +94 77 13 62 387